# මාගේ පැලේ (C)

©LankaSongBook - ලංකා ගී පොත

C G
මාගේ පැලේ අඳුර නසන්න - හිතෙනවා මනාලියක් ගෙනෙන්න
F G C
නිවසේ පුරා එළිය කරන්න - මට විනෝදයෙන් කාලෙ ගෙවන්න

C Am C Dm C
උපන් රටෙන් අඟලක් නැත මගෙයි කියන්න - මම අසරණයෙකි අතරමං වුන
F C
ඔය ඉර හඳ දෙකටත් බැරි විය අඳුර නසන්න
G C
මම තරුවක් අද අහසෙ පාවෙන

C Am C Dm C
මගේ පැලේ ඇඳ පුටු නැත සැපට සිටින්න - නැත සිනිඳු සේල හැඩට අඳින්න
F C
මට ඔය රන් මිණි මුතු මාල වළළු නැත පළඳින්න
G C
මම දුප්පත් බව නිතර සිතන්න

C Am C Dm C
රූප රාජිණියො කුමරියො මම සොයන්නෙ නෑ - ඔය ඉඩම් කඩම් මම බලන්නෙ නෑ
F C
ඔය කුල මල දෑවැදි කිසිවක් මම තකන්නෙ නෑ
G C
ගුණවත් ලලනාවක් තාම දැක්කෙ නෑ